# ලිහිණි ගල



මයුර ප්‍රේමරත්න

# ලිහිණි ගල

මයුර ප්‍රේමරත්න
B.A (ජ.පුර)

ප්‍රකාශනය:

සංස්කෘතික කේන්ද්‍රය

රුහුණ විශ්වවිද්‍යාලය.

ලිහිණි ගල

---

**© මයුර ප්‍රේමරත්න**

---

ISBN 978-624-5553-12-9

---

ප්‍රථම මුද්‍රණය : 2021

---

පිටු සැකසුම : එන්. එච්. ටී. අනුරුද්ධ

---

කවරය සැකසුම : සංජු උෂාන් රන්ගොඩගේ

---

ප්‍රකාශනය : සංස්කෘතික කේන්ද්‍රය
රුහුණ විශ්වවිද්‍යාලය

# හැඳින්වීම

කවිය නම් විවිධ ය. විවිධාකාර ය. විවිධ විටකදී විවිධ අරුත් සපයයි. එනිසාවෙන්ම එහි ගැබ්ව ඇත්තේ අලංකාර රසයකි. සුන්දරත්වයකි. එය සැමගේ නෙත් සිත් පිනවීමටත්, නිවීමටත් උපකාරී වන්නේ ය. ඒ නිසාම බොහෝ දෙනෙකු වෙනුවෙන් ලියවුණු පදවැල් සමූහයක් මෙහි අන්තර්ගතය හැඩ කරයි.

කවි සිත අවදි වූ විවිධ අවස්ථාවල දී ඒ හැඟුම් පන්හිඳ තුඩ සමඟ මුහු කරමින් මේ ගෙත්තම සිදු කර ඇත. බොහෝ දුරට ගැබ්ව ඇති පදවැල්වල අරුත සුසුම්ලන නිසාවෙන්ම එයට ලිහිණි ගල යයි නම් තබා ඇත. ප්‍රතිභාවකට එහා ගිය අත්දැකීම් හා හැඟුම මූලික කර ගනිමින් නිර්මිත ය. කියවීමෙන් මිනිසා සම්පූර්ණ වන්නේ යම් සේ ද ඒ කියවීම තවකෙකු තුළ ඇති කිරීමට උත්සාහ කිරීමද ඒ හා සම්පූර්ණත්වයට සපයන අත්වැලකි. එවැනි ප්‍රයත්නයක ප්‍රතිඵලයක් ලෙස මෙම එකතුව නිර්මාණය වුණි.

# පෙරවදන

සිංහල සාහිත්‍ය මෙන්ම ඕනෑම සාහිත්‍යකට අයත් රසවත්ම නිර්මාණයන් කාව්‍ය නිර්මාණ අතර ප්‍රබල ලෙස දැක ගත හැකි ය. ඇසට පෙනෙන මෙන්ම ඇසින් දකින දේ කවියෙන් ඉදිරිපත් කිරීම කවියෙකු සතු විශේෂ හැකියාවකි. මානව හිතවාදී ලෙස මෙන්ම විරුද්ධවාදී ලෙස කවිය හැසිරවීමට කවියෙකුට හැකි ය. මෙම කතුවරයා එම කාර්ය මානව හිතවාදී ලෙස හසුරුවා ඇත. එය මෙම හැකියාවේ කලාත්මක භාවිතයට කදිම නිදසුනකි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල පුස්තකාලයේ පුස්කොළ පොත් සංරක්ෂණ අංශයේ පුස්කොළ පොත් සංරක්ෂකයෙකු ලෙස සේවය කරන මොහුගේ ශාස්ත්‍රීය ජීවිතය මෙන්ම සාහිත්‍යමය හැකියාවද වර්ධනය කර ගැනීමටත් අනාගතයේදී තවත් මෙවැනි නිර්මාණ බිහිකිරීමටත් හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

අනුරා කෝන්පොල
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# ස්තූතිය

නන් අයුරින් සහය දුන්

*සැමට...*

තුටු සිතින්

**පිදුම**

ජීවත් වන ජීවිතය

# අම්මාටත්...

මියැදුන ජීවිතය

# තාත්තාටත්...

# පටුන


01. කොරෝනා 1

02. මගපෙන්වන්නා 2

03. උද්දිකාරෝ ආලිංගිත්වා 3

04. රාවණා 4

05. අපුරු බැඳුමක් 5

06. සඳේ අපි 6

07. ලසෝ සෝ ගිනි 7

08. අමාවක හද 8

09. සිත්තම් පෙම 9

10. හීනයක ඇඳි සිතුවමක් 10

11. නුගිනුරාගී ප්‍රථම හාදුව 11

12. මගේ මතකය 12

13. අවසර 13

14. සංසාරිණී 14

15. මංසල 15

16. දරන්නට බැරි උණුහුමක් 16

17. හඳක් අවැසි හදක් 17

18. රන්දෝලිය 18

19. දෙව්ඳ ඇසුණිද ඉකිබිඳුම් හඬ 19

20. දෝරෙ ගලනා දිය පොදක් 20

21. අම්මා කෙනෙක් 21

22. හැඟුම් 22

23. කුළුඳුල් තුරුණු කඳුළ 23

24. පෙම් සුවක රස 24

25. මීවිත සහ සාපය 25

26. රුකගම් සොඳුරිය 26

27. මගේ පන 27

28. තුහින ඉහිරුණ මලක් 28

29. පැල් රකින නුඹට 29

30. සත්තයි මට ඇහුණා 30

31. කුළුඳුල් තුරුණු කඳුළ 31

32. මධුවිත නුඹ 32

33. එන්න මා හද සොයා සැනෙකින් 33

34. අසම්මතයට නොවී අවනත 34

35. ඇහැලේපොල අම්මා 36

36. මැණික 38

37. ගෝම්බරී 39

38. පියාණනී 41

39. සයනයකි 42

40. නැදුන්ගමුවේ 43

41. ලිහිණි ගල 44

42. ප්‍රථම හාදුව 45

43. කලු මැණිකා 46

44. එක පාරක්, තව එක පාරක් 47

45. කළු මාමා 48

46. හිස වෙස් 49

47. සරසවියේ මතක 50

48. ඔයාගෙ උණුහුම 51

49. තවත් අම්මෙක් 52

50. මහාමායා නොවන් මව්නේ 53

51. කවියක් වී 54

52. අහී...(තාත්තෙ මං අහී..) 56

## 01. කොරෝනා

නොහිතපු වෙලාවක ආව නුඹ

මට මාව නැති කළා ටික මොහොතකට

හෙමි හෙමින් හිත හදන් ඇස් අරිනකොට

ආයෙමත් නුඹ එන්න හදනවා ලඟටම

කල්පනාවක හිත තියාගෙන

පාර අයිනක වෙලක සිරි විඳ

බලා හිඳිනකොට, පාර එහෙ මෙහෙ

කට කපලා බස් පිරී ඇත අද

නහය මුව වැසී මාස්ක් දාගෙන

එකා පිට එක ලඟින් හිටගෙන

හුස්ම ගන්නත් හිතින් බය වී

යන්නේ එන්නේ... රාජකාරියට

'කොරෝනා' දැන්වත් සමාව දියන්, මිනිසුන්ට

## 02. මගපෙන්වන්නා

හමන සුළඟක පහස විඳ විඳ
යදින හුස්මක ජීවයකි නුඹ
බිඳ වැටුණ සිත් සෙමෙන් සුවපත්
කරන සැනසුම් සුසුම් පොහොසත්

දසත දිග හැරි සුසුම ගෙන නුඹ
කරන මෙහෙයම අමිල මෙහෙයක්
දනන් සිත ධනයෙන්ම නහවන
අමිල වැස්සක් හඬින් නහවන

මාවතක් ඇත මාවතක් තුළ
සොයාගන්නට වෙහෙස වනු සිත
නොවේ කිසිදා ඉවතලනු නුඹ
නුබම බබළන සීනු හඬ නුඹ

## 03. උද්දිකාරෝ ආලිංගිත්වා

මහ විසල් මහ තුරු රජිඳ නුඹ

සදා සෙවනේ සිසිලසින් පිරි

සෙනේ ගඟුලේ කිමිද සැරුවෙමි

ආදරේ මහ සාගරේ වන්

හමන සුලඟින් පාව ඇවිදින්

සවන් මත නුඹෙ හඬින් අමතන

විටදි හී ගඩු නැගෙන විට හද

සනසවන්නට ලඟින් වුන් ඔබ

වැතිර මිහිමත තුරුලේ උන්නට

සරයි මා අසලින්ම නිති නුඹ

දෑස් හෙමිහිට පියා ගෙන මං... කියන්නම්..

උද්දිකාරෝ ආලිංගිත්වා...

**04. රාවණ**

පාර බලන් හිටපු මට

ඇවිත් කුදලන් ගිහින්

දුන්නු ගින්දර උහුලන්න

හුරු කලේ මට නුඹයි රාවණ

වසවරතිකම් ඇතිලු නුඹ ලඟ

දෙනෝ දාහක් වදන් දුන්නද

මගේ දිවියම රැක්කෙ ඇහිපිය යට

තියාන, වගෙයි රාවණ

රාම ආවත් සේනා සමඟින්

කොහොම යන්නද අඟුලු හැරගෙන

ඒත් රාවණ, සීතා වෙමි මම

භරත රජු හා සරණ ගිය කල.

### 05. අපූරු බැඳුමක්

වළාකුළු බැමි එකින් එක බිඳ

ස්නේහ මැදුරක දොරටු විවර කර

අපරිමිත ආදරය අතරේ

බැඳුන සිත් ඇත ලෝ තලේ

මිහි මඬල මැද රඟ හලක සිට

නැගෙන හඬ නද තාලයට ගෙන

නෙක රටා රෑ මවන අතරේදි

ගලා යයි ගඟ ජීවිතේ

සසර සරණට භවයෙ හමු වුණ

එකම මඟ සිට එකට හමු වුණ

එක්ව යන්නට හදින් ළං වුණ

අපූරු බැඳුමක් සදා නොමැකුණ

ආදරය පිරි ස්නේහයයි

ස්නේහයෙන් බැඳි ආදරයයි අපේ

## 06. සඳේ අපි

මහ රෑට තනිව මං

සඳ එක්ක දොඩනවා

මං එක්ක සඳ තනිව

මගෙ තනිය මකනවා

සඳ දන්න හැම දේම

මගෙ හිතේ තියනවා

දන්නවද සඳේ සඳ

මහද සඳ සොයනවා

හැඟුම්බර මහ රෑට පුරුද්දට වගෙ හදට

වරක් හැදුවම එබෙන්ට දුකත් හිතෙනව අඬන්ට

හෙට උදේ වෙන තුරා

සඳේ අපි දිවි තුරා

හැර බලන් කඩතුරා

යමං මියෙනා තුරා

## 07. ලසෝ සෝ ගිනි

වසාගෙන සුදු සිනිඳු පටකින්

වසං කර මං සැමට රහසින්

රැක්ක මගෙ හිරි ඔතප් සැනෙකින්

නුඹේ බැල්මට ඉඳුල් වූවා

කඩාවැටුණත් සක්වලට හෙණ

නොවේ අහිතක් මටම මා ගැන

මගේ සෙවණට විසල් තුරු රජ

නුඹත් නික්මුණි මාව අතහැර

දරාගෙන හද මඬල ගුලිකර

සඟවා ගෙන බිඳ බිඳින් පහලට

පතිත වන මගෙ ලසෝ සෝ ගිනි

විලාපය මැද දැවී අළු විය - අපූරුවට

මගේ හදවත මට ද හදවත

අඬගසන හඬ - ඇසෙයි, සිහිනෙන්...

## 08. අමාවක හද

පුන් සඳ නැගෙන දවසක්
ලස්සන එක හවසක්
සුදට සුදේ වත බබලන
ලස්සන සුදු නෙලුමක්

නෙලා ගන්න පිං මදි සඳ
අතේ දුරින් පිපියන් නුඹ
අමාවකට හද මඬලට
පායාපන් පුන් සඳ නුඹ

රකින්නට මං නුඹේ හදවත
පුදන්නම් හද පුදසුනක හිඳ
පුදසුනේ පිපි මදාරාවක්
වෙයන් සුවඳින් මා ද පිනවන

**09. සිත්තම් පෙම**

බඳ වටා රැලි එල්ලූ
සුදු ගවුම නොකියාම
මගේ සිත ඇදගත්ත
අපූරුව අපූරුවැයි

හිටගන්න නුඹේ ළඟ
පන්තියේ ඇවිදිද්දි
මගේ ඇස් වෙව්ලුවේ
අනෙකුංගෙ හිස් නිසයි

හවස ඇරුණම පංතියේ
එහා කෙලවර බංකුවේ
නතර වී නෙතු පියන් වසමින්
සිත්තම් කළේ මං - නුඹෙ රුවයි

## 10. හීනයක ඇඳි සිතුවමක්

හමාගෙන එන සුළං රැල්ලක

එතෙන්නට සෙනෙහසින් පෙම් බැඳ

පෙරු පෙරුමන් නිසා හෝ මං

ඔබේ කවියට පදවැලක් වෙන්නම්

බිඳෙන් බිඳ මෝරනා සෙනෙහස

හදින් හදකට දැනෙන්නට නම්

දන්නවද ඒ හදින් හදකට

පෙමක් අවැසි වග නම්

සසර මං මාවතේ හෙම්හිට

පියනඟන යස කිඳුරු පෙම්බර

කිඳුරියක් ලඟ නතර වෙනවද

හීනයක ඇඳි සිතුවමක් නම්

## 11. නුගිනුරාගී ප්‍රථම හාදුව

හීන් කලුවර තැගි අරගෙන

ගොම්මනේ මගෙ ඇකයෙ තුරුලට

එන්න සඳ මගෙ පහන් පැල අද

තාම ආසයි පහන් එළියට

නෙතින් ගිලිහුණ සුසුම් පොදි බැඳ

දෙතොල් පිරිමැදි රසවිතක් ලෙස

ගෙනෙන හසරැලි උරුම ළමැදේ

පහස සමගින් නුරාගී වුණ

සෙමින් අත්හල දෙතොල මත තොල

ගොතන කවියේ රහස අමයුරු

රසයි කලතන පිපාසය සිඳ

නුගිනුරාගී ප්‍රථම හාදුව

**12. මගේ මතකය**

නෙතු දැල සනහන්න

රත් දෙතොල් මත් වෙන්න

හවසකදි උඹ එක්ක

ලංවෙලා එක්වෙන්න

ඇවිලෙනා ගිනි දළුවක ද මම

නුඹේ ප්‍රේමයෙ පහස විඳි බව

පසක් වෙනකොට තැනක ඉඳහිට

රේල්ලුවෙ මං තනිව හුණි ලැග

මගේ මතකය පාර පාරා

දෙතොල් පහසක සුවඳ දැණුනා

ඇසේ අග රැඳි කඳුළු බිඳුවක

අපරිමිත සෙනෙහසක් ගැලුවා

## 13. අවසර

වසාගෙන නෙතු දෑල හෙමිහිට
හීන මවමින් ඔබේ සියොලඟ
දැවටෙමින් මුදු සුමුදු දෙතොලත
තෙමෙන්නට පෙම් රසින් අවසර

දෑස අබියස රැඳුණ ඔබෙ වත
දුටුව සිත මට නොවේ අවනත
නෙතට ලංකර පහස විඳිනට
වරක්වත් මට දෙන්න අවසර

රේල්ලුව තව දුර ඈදෙනකොට
අපිට අපි හමු වෙයිද සිත් මට
හීන් හිරිකඩ සමඟ විඳිනට
නුඹේ ලය අමරසකි රසවත

## 14. සංසාරිණී

පෙරුව පිරුමන් ලෙසට හද රැඳි
චන්න කින්නර පෙම් කතාවේ
හදක් සනසන අමවිතයි, නුඹ
මහද සැලමුතු කින්නරී

අඹර ලෝ තල අවරගිර සිප
නැවුම් හැඟුමන් සමඟිනී
මළ හදට යලි ප්‍රාණ ජීවය
වැඩම වූ ශ්‍රී දේවිණී

සසර නිවනට පියමනින තුරු
එක්ව සරණට සරණ රැකුමෙන්
දන්නෙමී මං, නුඹේ හදවත
මටම කැප බව - සංසාරිණී

## 15. මංසල

වෙන නදට හුරු වෙන්න
තත් නගන හඬ අහන්
මං එනනෙ මංසලට
නුඹෙ නමට නොයිඳුලෙන්

වස්දඬු ද අතරමැද
නගන හඬ ඇහුණා දැං
දන්නවද මගේ හද
සැනයකින් හැඬූ තරං

සසල හද නිසල විය
දෑස මගෙ අන්ධ විය
වස්දඬුද වෙණ නඳ ද,
එක නදක වැයෙනු දැක

## 16. දරන්නට බැරි උණුහුමක්

සිනාසෙනකොට දෙතොල් සනහා
විඳින්නට සිප වැළඳ ආසයි
දරන්නට බැරි උණුහුමක් - ඒ
හාදු වැල්වල රැඳුණ ගානයි

වරක් නොව තව වරක් මා ළය
පිරිමදින හිස හොවා ළය මත
දන්නවානම් විදුලි සැර මෙන් - නුඹ
එනවා සත්තයි මගේ තුරුලට

දුටුව හැම වරක් පාසා
මගේ හදවත අළු වුණා - ඒ
දැවෙන ගින්නෙන් මාත් ටික ටික
නුඹත් එක්කම බෝ වුණා

**17. හඬක් අවැසි හදක්**

සිහිල් සුළං රොදක් වගේ

නුඹ ඇවිදින් ළඟට මගේ

ගෙත්තම් කළ කවක අගේ

පද සොයනෙමි හතර අතේ

ඒ හින්දයි සිහින අගේ

මහ රෑ සයනයට වෙලා

දෑස් යොමා නුඹව සොයා

ගොම්මන් හද පාලු වෙලා

හඬක් අවැසි හදක් මෙමා

සඳ මඬල වඩින තුරා

තරු පංතියෙ පාට අරන්

නුඹ එනවද හීන මවන්

ඒ එනකල් මං තනියෙන්

සැනසෙන්නම් දෑස පියන්

විඳගන්නෙමි රුව සිහිනෙන්

### 18. රන්දෝලිය

රන්දෝලියට සිරිකත වෙලා මං

වඩිනකොට සලුපිලි ඇඳං

හිමි, දෑස නොපියා බලා හුනි මං

සිනා මන්මත් කරමිනා

පාද පහසින් මැදුරෙ දොරගුළු

විවර වූ දා මා නමින්

මගෙ හදට බැඳි සෙනේ දම් තව

උතුරලා ගැලුවේ සතුටින්

කාලයයි ගෙවෙනා විටින් විට

මැදුර දැල්වෙන පහන් සිරියෙන්

දිනෙන් දින එය සසිරිබර වුණි

මා පිය සෙනෙහස අපට උරුම වුණි

## 19. දෙව්ඳ ඇසුණිද ඉකිබිඳුම් හඬ

හද දෙවොලේ දොරටුව ලඟ

මදක් අඬවන් දෙනෙත් ඇරගෙන

යදින දෙවියන් නමින් පැතුවේ

නුඹේ රුවමයි හිතවතානෙනි

වරක්වත් මගෙ ලඟට තුරුලට

එන්න අයැදිමි දෑත් එක්කොට

නෙතඟ විහිදෙන කඳුළු හෙමිහිට

ඔසරිපොට අග සඟවගෙන මම

කෙලෙස මේ ලෙස තනිව යන්නෙද

මගේ තනිකම නොහැක ඉවසනු

වරක් බලපන් නෙතුපියන් ඇර

දෙව්ඳ ඇසුණිද ඉකිබිඳුම් හඬ

ආයාචනාවයි නුඹට කරනා

ආරාධනාවයි නුඹට කරනා

ආයාචනා ආරාධනා

## 20. දෝරෙ ගලනා දිය පොදක්

හදවතට අඬන්නට වරම් දුන් නුඹ

කඳුල හෙමිහිට තුරුළු කරගෙන

නාඬන්න මගෙ ළඟින් හිඳගෙන

සිපගත්ත මගෙ මුදුන නලලත

දෝරෙ ගලනා දිය පොදක් වී

හදේ පතුලට ගලාගෙන විත්

සත්තමයි මිහිදන් වුණා

සසර නොබිදෙන පද වැලක් වී

පෙරදා සිහින පරදා නුඹගේ

සිහිනය සිනහව කැන්දන් ආ සඳ

නොවෙද මිහිරක් තෙරක් නොපෙනෙන

වරක් ඇසිපිය පියා සිතනුව

**21. අම්මා කෙනෙක්**

පහන් පැලට එලිය දෙන්න

පහන් සිලක් වී නැගෙන්න

පහන් සිතට උදව් වෙන්න

පහන් හැඟුම් පුබුදුවන්න

අගු පිලේ ලණු අඳක

වැතිර හුන් ඔහු දිහා

දුටුව මගෙ නෙත් දෙකම

දියවෙලා ගිලිහුණා

කාරණය දන්න මං නෙත් දෙකම බිම තියන්

පියවරින් ගෙට වුණා අගුපිලද පහු කරන්

පුංචි වුන් අඬනකොට ලඟට විත් වී බදන්

මගේ හිත නිදියාවි, වෙන එකෙක් හිර කරන්

## 22. හැඟුම්

හදේ නලියන හැඟුම් මැරුණම

රිදෙන හිත හරි වේදනයි - මට

දරන්නටවත් බැරිම වූ තැන

නුඹෙ රුවම මට ලෙංගතුයි - අද

වරක් ඇසිපිය වසාගෙන මම

නුඹේ රුව ගෙන මසිතෙ ඇන්දම

දැනෙන තනිකම වේදනාවද

දරන්නට මට නොහැකි ගානට

සුළං වේගෙන් සැඩව ඇවිදින්

නුඹේ තුරුලේ නතර වෙන්නට

වරක්වත් මට දියන් අවසර

අසරණව මියැදෙන්න කලියෙන් - මං

## 23. කුළුඳුල් තුරුණු කඳුළ

ගලන කුළුඳුල් තුරුණු කඳුළක
රසය නුඹ තව දන්නෙ නෑ  - මට
හැඩට පෙනුනට කඳුළ නිතරම
සතුටු සිතකින් ගැලුවෙ නෑ
ගැහෙන හදවත ගැහෙන සද්දෙට
නුඹේ හැගුමන් උරුම නෑ - මං
දන්න හන්දා හොඳට නුඹ ගැන
තනිව මඟ තොට රැඳුණෙ නෑ

තුරුලෙ හිනැහෙන විටදි උණුසුම
හදට කඳුළට නැගුණෙ නෑ - මම
පාළු ගොම්මනෙ තනිව උන්නම
හදින් කඳුළක් නැගුනෙ නෑ

## 24. පෙම් සුවක රස

අනෝරාවක වැටෙන වැහි කැට
ගලාගෙන විත් දියඹ තුරුලේ
කැදලි තනනට හිතක් වේ නම්,
අවසරයි ඒ සිතට දියඹින්

සීත පින්නට පෙම් කරන සඳ
අනෝරා වැහි කෝම දැණුනිද
වරක් ඇසිපිය පියා සිතුවම,
දියඹටත් උණුවෙනවා හදවත

රුසිරු සුසිනිඳු දෙහද කැලතුණ
පෙම් කැදැල්ලක සිරිය විඳ විඳ
මදක් මී විත දෙතොල ගාගෙන
සිතින් වින්දෙමි පෙම් සුවක රස

**25. මීවිත සහ සාපය**

හඬ ගසා සැනසෙන්න පාරමී පුරන්නම්

නුඹ බලා සැනසෙන්න මඟබලා හිඳින්නම්

සුවඳ විඳ සැනසෙන්න නෙතුපියන් වසන්නම්

හීනයට පන දෙන්න තුරුලෙ ඉඩ තියන්නම්

රැය පහන් වන තුරා නෙත් අතර සැරිසරන

හෙලන හුස්මක් පුරා නුරා ගිනි උඩු බුරන

ළය රාව ගැහෙන හඬ මහ හඬින් ඉකි ගහන

දුක නිවන ඔසුවක් ය නුඹ, නමින් මං පතන

නුඹෙ දෙතොල් පහස විඳි

රස නහර මියැදියං

නුඹෙ වදන් ඇසූ සවන්

පැලී හඬ නැසියං

බලා සැනසුණ මගේ

නෙත් යුගල අඳ වෙයන්

නුඹෙ සුවඳ විඳි නිසා - මා දැවී අළු වෙයං

### 26. රැකගම් සොඳුරිය

කකියන හදවත දෙනෙතින් මොර දෙන
කඳුලු පොදක රැඳි අමිල සිතුම්
හිරකරගෙන මං නුඹ ළඟ උන්නම
දෙනෙතින් වැටෙනා සතුටු සුසුම්
කාලය ටික ටික ගෙවෙනා බව දැන
මියැදෙන දින දින සුවඳ පියුම්
සැනෙකින් විනිවිද කාලය ගෙවුණිද
උදුරන් අපගේ සොඳුරු පැතුම්

අවසන් ගමනට සැරසෙන නුඹේ වත
දැක දැක හදවත මියැදෙනකොට මගෙ
හංගාගෙන මං නුඹ ළඟ උන්නේ
තනිය මකන්නට මළගම සමඟම

ළය තුරුලේ විඳි පෙම් සුව අමතක
නොවන මගේ හද නුඹ මිහිදන් කළ
රැකගම් සොඳුරිය නුඹ එනතුරු එය
නුඹේ මතකයන් තුරුලේ රැකගෙන

## 27. මගේ පන

හිතට ලෙංගතු නුඹේ සෙනෙහස

තව ටිකයි මගෙ හිතට දැනුනම

තද කරන් ලැම ඉකිගසයි දැං

දරාගන්නට නොහැකි හින්දම

ඇවිද ආ මාවතේ අතිනත

පටලගෙන අපි සෙනේ විඳ විඳ

කෝම දුක් විඳ දරාගන්නද

අතහරින්නට නුඹේ අත මම

තුරුලෙ සැනසුන සෙනේ ගඟුලට

සුබ පතන්නද? කෝම සිතුණිද

කසාවත හැර මටම පෙම් බැඳ

මගේ වෙනවද මගේ පන නුඹ

## 28. තුහින ඉහිරුණු මලක්

තුහින ඉහිරුණු මලක් තුරුලේ හොවාගෙන
සහස් පැතුමන් නෙත් පියන් හිත පුරෝගෙන
වරක් පාසා අනන්තය වෙත පියමනින
තාම කව්දැයි මං, මං ගැනම සොයන

වරක් විඳ විඳෙව්වාම සැපක් කොහි දැනේද
සිතක් ඉකිබිඳ කඩා වැටුණුම හැඟුම් යලි උපනේද
වියෝවන හද තුරුලෙ විඳි සුව හිතින් මිලිනව යාද
මටත් පුදුමම මටම අවනතවූ මගේ සිත දුර තනි වීද

සත්තයි මං යනවා යන්නම එන්නෙ නෑ ආපසු හැරී
මලොත් නුඹෙ හිස ළගින් දැල්වෙන පහන් සිල වී
එළිය වෙන්නද නුඹේ හිත රැඳි ඔහුට තනියට
නුඹත් ඔහු වෙත ගියපු හින්දම

## 29. පැල් රකින නුඹට

සාර භූමිය සාර කරනට
සාර හෙළු මගෙ අපුච්චා
රෑට හෙම්හිට ගෙපැල පිල මත
ගෙපැල තනි රැකි අපුච්චා

හෙලපු දා දියවලට නිවනක්
රැයෙදි ලබතැයි කියා සිතමින්
මමත් ආවා ආරෙ රකිනට,
නිදිවරන්නට පැලට තනියම

වන අලිලු මහ කැළේ පීරා
හේනෙ සාරය උරා බොන්නේ
අපුච්චාගේ හෙළූ දා දිය
වන රජිඳ බොට කෝම දෙන්නේ

**30. සත්තයි මට ඇහුණා**

රෑ අහසේ පායන තරු

නුඹට හොරෙන් හිනා වෙනවා

බලන් ඉන්න හැම මොහොතෙම

මගෙ හදවත මට කියනවා

සත්තයි මට ඇහුණා

සඳ එන තුරු අහස බලන්

සුසුම් මැදින් නැගෙන කඳුලු

රෑරාගෙන ඇද හැලුනම

නුඹෙ හිනාව මට විතරද

සත්තයි මට දැණුනා

දන්නවා නම් හඬන තරම්

මේ හිත මහ රෑ තනියම

සත්තයි නුඹ ළඟින් ඉඳන්

සනසයි මා හැමදාමත්

සත්තයි මට හිතුණා

## 31. කුළුඳුල් තුරුණු කඳුළ

ගලන කුළුඳුල් තුරුණු කඳුළක
රසය නුඹ තව දන්නෙ නෑ - මට
හැඩට පෙණුනට කඳුළ නිතරම
සතුටු සිතකින් ගැලුවෙ නෑ

ගැහෙන හදවත ගැහෙන සද්දෙට
නුඹේ හැඟුමන් උරුම නෑ - මං
දන්න හන්දා හොඳට නුඹ ගැන
තනිව මගතොට රැඳුණෙ නෑ

තුරුලෙ හිනැහෙන විටදි උණුහුම
හදට කඳුලට නැගුනෙ නෑ - මම
පාළු ගොම්මනෙ තනිව උන්නම
හදින් කඳුලක් නැගුනෙ නෑ

## 32. මධුවිත නුඹ

හිරුටත් හොරෙන්
හරි හරියට හනි හනිකට
අවදිවෙලා දවස තිස්සෙ
පොර බැදුවම එක ගානට
දැනෙන විඩාවට ලාවට
මධුවිත නුඹ හරිම අගෙයි

දෑස පියා උඩ බලාන
හීන දකින හැම වාරෙම
දරු පැටියයි ඈ තනියම
තනි මැකුවේ හැම හීනෙම
මධුවිත නුඹ මා පාරයි

මගේ පුතේ හෙට දවසට
අවදිවෙන්න අප්පච්චිට
වැඩි ඉඩ නැහැ සිත තියාන
රජ වීයන් හනි හනිකට
හිරු නැගෙන්න කලියෙං හෙට

මධුවිත නුඹ හෙට හවසත් ?

## 33. එන්න මා හද සොයා සැනෙකින්

සියක් පෙති මත සියොත් හඬකට
ලතෙත් හදවත සසල වෙනකොට
දෙනෙත් අග රැඳි කඳුල පිස මුව
සිනාසෙමු අපි එකට පෙම්බැඳ

සරන්නට යුග යුග සරන්නට
පති පතිනි පෙම් දම් පුරන්නට
හදෙහි මත හිස නලලතෙහි මත
නුඹත් මං වගෙ හිතුවෙ කොහොමද

සඳට හිරු මෙන් හිරුට සඳ මෙන්
ඔබට මට අපි අපිට රහසින්
සෙනෙහෙ වඩනට සිතෙහි පත්ලෙන්
එන්න මා හද සොයා සැනෙකින්

## 34. අසම්මතයට නොවී අවනත

වසන්ත සමයක හැන්දෑ වරුවක
නුඹේ උකුල මත හිස හොවා
දෑස් හෙමිහිට අසංවර සිල්
බින්දෙ නෙතුපිය නොසඟවා
අඳුර හෙමිහිට වඩිනකොට සිත
සීත උණුසුමෙ විඳ හොවා
කලක් විඳි පෙම් විලක් මැද අද
මතක මා තනි රකිනවා

දරන්නට බැරි උණුහුමක මං
ගුලිවෙලා විඳි සීත සුසුමන්
දරන්නට බැරි සීතලක මං
විඳිනවා අද මසිත කඳුලින්
ඉතිං
ඌජියාමා නැකිටපන් දැන්
දවන්නට මා සීත කඳුලැල්
ඉතිං... හැකි ද?

වරක් නොව තව සහස් වරකදි

ලබන්නට ඒ සුවඳ මුව රැඳි

පතන්නෙමි නෙක සාධු සම්මත

අසම්මතයට නොවී අවනත

## 35. ඇහැලේපොල අම්මා

ගතපුරා දිව් රුහිරු ධාරා
ලෙයට හැරවී පිරුණ තන පුඬු
බලාහිඳිනවා දැයට පොවනට
මෙලක දලුලන නේක පුතුනට
පොවන්නට ඇකයේ හොවා

ඇහැලේපොල/// අම්මා

රකින්නට රට දැය ද ජාතිය
ආගම ද මේ දෙරණ සරුවට
නොවේ පාවා දෙන්ට කිසිදින
පුතුණී හිස ඔසවන්ට දිරිගෙන
තොල තෙමා සිහිකරන් පෙව්කිරි

ඇහැලේපොල/// අම්මා

පතිනිදම් රැකි කුලවමිය වී

පතිනි කුලයේ අනුරුවකි ඈ

ලෝල උන්ගේ ළයට එරෙහිව

නැඟී සිටි කන්නගී විලාසය

දියණියනි සිහි කරන් සැම දින

ඇහැලේපොල/// අම්මා

### 36. මැණික

හෙමි හෙමින් මං නෙත් පියා
ඔහේ යනකොට ඇවිදලා
හීන් හඬකින්වත් ඇසෙයි නම්
මැණික, නුඹ කොහිදැයි කියා
හනික එන්නම් මං
හීන අස්සෙන් පියඹලා

කලක දී තෙපලූ වදන් දැන්
වෙනකෙකුගෙ වී සන්තකයි
මාත් හෙමිහිට දරා ගන්නම්
ඒ බලා නුඹ සනසවා
හනික යන්නම් මං
හීන අස්සෙන් පියඹලා

වරක්වත් නෙත් විවර වන්නට
ඉඩ නොදී මා බලා හිඳිනෙමි
අමතනා තුරු මා නමින් නුඹ
මැණික, නුඹ කොහිදැයි කියා
හනික එනවද දැං
හීන අස්සෙන් පියඹලා

## 37. ගෝඹරී

ලෙන් පතුල විනිවිද නිදන්නට
නිහඬ වී රහසේ හිඳින්නට
සදා මෙලෙසින් වසන් වන්නට
සිතන් උන්නට ගෝඹරී - නුඹ
නොවේ අවසර තෙලිතුඩින්

හෙලන හැම සුසුමකම පාසා
ප්‍රාණසම සුසුමන් හඬින්
ප්‍රේමණීය සිත් දැහැන බින්දේ
ඇසුන මරහඬ රැව් දිදී
සිතන් උන්නට ගෝඹරී - නුඹ
සැඟව යන්නට මිහිමතින්

හෙලා සුසුමන් නොවේ ඉවසුම්
සොයා මිහිමව් තුරුල පීරා
රතට රත හිරියලින් නහවා
නුඹ සිටියෙ මව් තුරුලෙ සඟවා

සිතන් උන්නට ගෝඹරී - නුඹ

නොවේ අවසර නිහඬ වන්නට

අවසරයි හඬ විවර කරනට

ළමැද රැඳි ගිනි මුදා හරිනට

අවසරයි...../// 

### 38. පියාණනී

නුඹ දකින්නට නුඹ ළඟට ඇවිදින්

හෙමින් පියමැන පියගැට පෙළේ

කෙසර පා මුල බලා හිඳිනෙමි

අලකපුරවර මන්දිරේ - පියාණනී

පවුරු බිතු මත සදා නොමැකෙන

සිතුවමක් වී බලා හිඳිනට

දනන් නෙත සුවපත් කරන්නට

නුඹෙ නමට නොම නිගාවන්නට - පියාණනී

මෙසිරිලක සිරි සසරි නංවා

ධරණී තලයම සුවෙන් සතපා

ළඟින් හිඳිනට දෙන්න අවසර

ඔබේ මැදුරේ අගුලු හැරදා - පියාණනී

### 39. සයනයකි

රෝස පෙති මත දෙතොල සඟවා
අමවිතේ රස කලතමී
මත් වුණා මෙන් සයන සක්වල
රැයපුරා මත් වී ඉමී

නිලට සැරසුණ සඳ රාජිණිය - මා
නෙත් වශී කළ උන්මාදිනී - මා
නෙත් යුගල මත මුදා හල - මා
හිසින් ඔසවා උහුලමී - මා
තිසර පැටියුග සියුමැලී

බර වැඩීයි මා ඇඟිලි තුඩු මත
මුදා හල ඇගෙ තිසර පැටවුන්
ඉගිල යන්නට තටු සලයි - මා
තුරුලෙ රඳවා සඟවමී

**40. නැදුන්ගමුවේ**

නුවර යනකොට රජුනි නුඹ
මං බලාගෙන මං හිඳින්නම්
මහා වැස්සේ වුවද ඉන්නම්
නුඹේ රුව දැක සිත පිරේනම්

ඡද්දන්තය කුල අයිරාවන වන්
මහා පින් ලද නැදුන්ගමුවේ
විජය රාජා පෙරුම් පුරනා
බෝසත් කුලේ බෝසත් රජුන්

දෙනෝ දාහක් සාධු නද ලැබ
නිවන් මග වඩිනා රජුනි ඇත්
සහස් සුවහස් දනන් සිත්
සමඟ සම වැද නිවන්පුර යත්

**41. ලිහිණි ගල**

ලිහිණි ගල පය ලිස්සලා මා
ලිහිණි තුරුලේ සැතපුණා
කතර තෙත් කළ අනෝරා වැසි
ලිහිණි පා යුග දොවා හැඩුවා

වසන් වෙනකොට දෑස විනිවිද
හිතට මගෙ මහ බයක් දැණුනා
මගේ සුරතින් ගිලිහිලා නුඹෙ
සුරත සුළගේ සටනෙ යෙදුණා

රකින්නට මට නොදී වරමක්
ලිහිණි හෙල නුඹ පැහැර ගත්තා
ලිහිණි නුඹ කළ වරද හින්දා
මහද ගැහැණුන් දවා දැමුවා

## 42. ප්‍රථම හාදුව

නිසොල්මන් වුණ නිහැඬියාවක
සයන මත ඉඳ ලයට තුරුලුව
ලැබූ පහසක නළල මත තැබූ
ප්‍රථම හාදුව තමයි ප්‍රේමය

හිරුත් හෙමිහිට බැස යාවී
සඳුත් හෙමිහිට බැස යාවී
මලුත් හෙමිහිට මිලිණ වේවි
නුඹත් මා හැර දුරක යාවී

ලබන්නට නැත තවදු පහසක්
එලද පහසම මහද බැඳගත්
නිසයි තවමත් වෙන්නෙ ජීවත්
තවත් නොපතමි එබඳු පහසක්

## 43. කලු මැණිකා

ලංවෙන පසලොස්වක සඳ බලන්න

මහ රෑ මැද එලිපත්තේ - මං

බලං ඉන්නකොට දැණුනා මං බලන්න

නුඹ එන වග ඒරොප්පෙ - ඉඳං

ගිය පෝයට පෑයූ සඳ

වගේ නොවෙයි දැං

මේ පෝයට පායන සඳ

මගෙ ළඟමයි දැං

වහං වෙන්න මාන බලන

ඒරොප්පේ සුවඳ සොයන

ඒ මේ අත නුඹව සොයන

කලු මැණිකා මං - නුඹෙ

කලු මැණිකා මං

## 44. එක පාරක්, තව එක පාරක්

එක පාරක්, තව එක පාරක්
පාව එනවද නුඹ
කස්තුරි සුවඳේ දැවටිලා
මගේ ළමැදෙ තුරුළු වන්නට
　　　　එක පාරක්, තව එක පාරක්

සුළං පහසක වෙලී හිඳිනට
ඔබේ උණුහුමෙ තුරුළු වන්නට
බලා හිඳිනා ළමැදෙ රණ හස
සනසවන්නට යලිත් එනවද
　　　　එක පාරක්, තව එක පාරක්

කිරි ගැහෙනා එකඳු බැල්මක
ගල් ගැසුන හද තුරුළු කරගෙන
කොපුල් තෙමනට හාදු වැස්සේ
නුඹටමයි ඇරයුම් ගෙනෙන්නේ
　　　　එක පාරක්, තව එක පාරක්

**45. කළු මාමා**

දෙකට නවමින් සරමෙ කැහැපොට
තබන පියවර හස්ති ශෛලෙන්
කෙලෙස නොදෙවෙනි නොවේ නොදෙවෙනි
ගමන ගජගා මාමගේ කළු

මාලිගාවේ පවුර පාමුල
සමිද වේවා නමස්කාරය
තබා දණහිස ඇත් ද මිනිසෙක්
එකට අත් බැඳි වර අනන්තයි

"හස්තියෙකු නොව පුතුණි නුඹ මට
රජෙකි මා හැදු උරෙහි ඔසවා
දෙනෝදාහක් සාදු හඬ මැද
ලබන සසරෙත් අපි, අපෙම වේවා ..

**කළු මාමා (විල්සන් කොඩිතුවක්කු)**

## 46. හිස වෙස්

හේරි නාද හැඩ කරවන

රුහිරු හඬන විට තාලෙට

සිරුරෙන් මනු නෙත් පිනවන

වාසනාව හිස වෙස් ගෙන

හස්ත පාද නොව නවතින

තාලෙට දිව නහර හඬන

මිහිරි හඬින් ගොතා ගයන

වළලුකරින් හඬා රඟන

රුහිරු රැගෙන දෝත පුරා

සමිඳ පුදමි සසර පුරා

තෙවැනි ඇසට ගැටුන දරා

වේදනාව මුදමි හැරා

## 47. සරසවියේ මතක

ඉඩෝරයක හමානආ
සිහිල් බිඳක සැඟව පාව
නතර වෙලා සරසවියේ
බැම්මක හිඳ සිනා සලපු - නුඹ

ඉඳහිට හෝ රංඩු වෙවී
හිතේ තිබුණ කාංසාව
ආදරයෙන් වසා ගන්න
මා ඇමතු - නුඹ

අසීමිතය පෙම් බැඳි බැමි
අප්‍රමාණ ලෙංගතු හිත්
සසර පුරා හමුවෙනවා
මා ළඟ හිඳ හිනැහෙනවා - නුඹ

## 48. ඔයාගෙ උණුහුම

දැනෙනකොට රසය කඳුලක

සත්තයි ඔයා එන්නෙ මගෙ සිහියට

තුරුල් වෙනකොට සිහිල් සුළං පහසක

දැනෙන්නෙම ඔයාගෙම උණුහුම

හැන්දෑවට මලක් වෙලා පිපෙන්න මගෙ ගාව

රෑ පුරාම සුවඳ දිදී සතපන් මා හැමදාම

මැරුණු හීන අතර නිදන මා අරගෙන ඇත

යනවා නම් මං එන්නම් හීන අතැර හනික

පහන් පැලක් එලිය වෙන්නෙ පහනක් ඇති දාටයි

දැල්වෙන පහනක් නිවන්න සුළං රොදක් ආවයි

දොලොස්මහම එලිය දිදී දැල්වෙන එක පහනයි

මැණික මගේ පහන් පැලම දල්වන්නට බාරයි

## 49. තවත් අම්මෙක්

සඳේ සඳ රැස් ඉතිරි ඉතිරී
ගලනකොට පෙන කැටි නගා
සුදු දුවේ නුඹෙ සිනාවත් ඒ
සඳේ රැස් පරදන කතාවක්

තාත්තාගේ උකුලෙ නැලවෙන
අම්මගෙ උණුහුමේ නැලවෙන
දෙවඟනකි නුඹ පුංචි පැල්පත
සිනා කඳුලින් පිරී ඉතිරෙන

රෝස කම්මුල් සිඹිනකොට මං
නුඹේ දෑසම වැළඳ ගත්තෙමි
තවත් අම්මෙක් සැනින් දුටුවෙමි
දෑස සිඹ රැකවලින් වැසුවෙමි

## 50. මහාමායා නොවන් මව්නේ

මහාමායා නොවන් මව්නේ ප්‍රජාපතියම වී
නුඹේ තුරුලේ ළමැදෙ තුරුල් වෙන්නම්
ළමැද උණුහුම පහස විඳිමින්
දුරින් හිටියත් තුරුලු වෙන්නම්

වැටෙන කඳුලැලි දරා ගන්නම්
දැනෙන විරහව අතැර යන්නම්
මදක් ඉඳහිට නතර වෙන්නම්
මව්නි මා පසුපස හිඳී නම්

අතැර යන්නම් සියලු සම්පත්
අතැර නොම යමි නුඹේ තුරුලෙන්
වැතිර සයනය නුඹ දකිනකොට
සොමි කිරණ මා බබලවනු නම්

නිවන් දක්නා ජාති ජාතිත්
වරම් දුන මැන - මුණ ගැහෙන්නම් ... අම්මේ

## 51. කවියක් වී

දවසක් ගෙවිලා දවසක්
උදා වෙනවා සත්තයි
මලකුත් පිපිලා මලකුත්
පරවෙනවා සත්තයි
සිනහව සනසවන සිනහව
අග රැඳුණෙම කඳුළක් සත්තයි
අද එන කෙනෙක් හෙට
වෙන කෙනෙක් වෙනවා සත්තයි

රෑ තනියම අහස බලන්
කවියක් වී කඳුලු අරන්
එනකොට නුඹ නුඹම සොයන්
සැනසීමෙන් බලා හිඳින්

වැටෙනකොට වෙන තුවාල
ගැන නොහිතා ගෙන හිතට
ගෙන සවිය හිරු විලස
දෙපයින්ම නැගිටින්ට

එයයි සැනසුම අසල

නිසල දේහය සසල නොම වන

**52. අහී...(තාත්තෙ මං අහී..)**

කිරට හරවා නුඹගේ

රුහිරු සයුර මතු සසරේ

එතකොට මං ඉන්නම් නුඹෙ

ඇකයේ කිරි බිබී

දෑස දෙස බලා තනපුඬු

හෙමින් සප සපා උණුහුම

ලබා ළමැදෙ නැළවෙන්නම්

සසරෙ මතු මතු

නිවන් දකින්නට යනවද

මාව හැර දමා හනිකට

කෝම මං ඉඳින්නද? තාත්තෙ,

ඇඟිලි හැම තැනම ඉස්සෙනවා ... හම්

දිනෙන් දිනම මගෙ නමට

# පසුවදන

ජීවිතය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට නම් මදක් නතර වී හෙලන සුසුම් සමඟ මතකය අවධි කළ යුතු ය. කළ දෑ මෙන්ම කළ යුතු දෑ ද සිහියට ගලන්නේ එවිට ය. ඒ සඳහා රසයක් එක් කරමින් පද වැලකට ගැලපීම රසවින්දනාත්මක කලාවකි. විඳින ජීවිතය රසය සමඟින් පුරවාලන්නට වචන මඟින් සපයන්නේ ප්‍රබල දායකත්වයකි.පාඨකයාගේ චිත්ත සන්තානය රසාලිප්ත හැඟුම් සමුදායකින් පුරවාලමින් හදෙහි උපදිනා සිනා පොදි වචන විනිවිද දෑස් තෙමමින් මුව මඬල පුරා විහිදුවන්නට සමත් නම් එකී කවියා සමත් ය. සිත් දැහැනේ නවතාලමින් විඩකට හෝ නතර කරලන්නට සමත් නම් එකී කවියා මානවහිතවාදියෙකි. කවියකු වචනයෙන් පවා එලෙස විය යුතු ය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය පුස්තකාල පුස්කොළ පොත් සංරක්ෂණ අංශයේ තාවකිලික ප්‍රදර්ශකයෙකු ලෙස සේවය කරනු ලබන මයුර ප්‍රේමරත්න මහතා ද සිය වචන හැසිරවීමේ දී සිදු කර ඇති හරඹය ද ඒ අතර එවැනිම ය. මිනිස් සිත සනසාලමින්, සුවපත් කරමින් මෙවැනි නිර්මාණ ඉදිරියටත් සිදු කිරීමට ඔහුට ශක්තිය ධෛර්ය ලැබේවායි සුබ ප්‍රාර්ථනා කරමි.




මේනකා නිශාන්ති
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



ප්‍රකාශනය
සංස්කෘතික කේන්ද්‍රය
රුහුණ විශ්වවිද්‍යාලය.

ISBN 978-624-5553-12-9